අංක 1
1976 අගෝස්තු - සැප්තැම්බර්
මිල රු. 1.50 යි

'මාවත' ප්‍රකාශකයෝ
අසෝක පොත් හල බාරේ,
183 ගාළු පාර,
කොළඹ 4.

# මාවත

ප්‍රගතිශීලී කලා, සාහිත්‍ය හා සංස්කෘතික ප්‍රකාශනය

## මෙවර කලාපයේ

අපේ සංස්කෘතික ප්‍රශ්නය - 1
— සංස්කාරකවරු

තුන්වැනි ලෝකයේ සාහිත්‍ය අරගලය ගැන - 7
— එස්. ජී. පුංචිහේවා

අම්බලමේ පිනා සොයා යාම - 9
— පරාක්‍රම කොඩිතුවක්කු

අතරමැදි මාවතක් නැත - 14
— පියල් සෝමරත්න — කුමුදු කුසුම් කුමාර

ඉතිහාසයේ වර්තමානය - 17
— සේනක බණ්ඩාරනායක

දෙමළ නාට්‍යයේ ප්‍රගතිශීලී ජයග්‍රහණයන් - 19
සුසිල් සිරිවර්ධන

සිංහල ලකුණ - 21
— මාර්ටින් වික්‍රමසිංහ

ගමෙන් හඬක් - 23
— මොනිකා රුවන් පතිරන

මෙහි පළවන ලිපි ඒ බව සඳහන් කරමින් සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යළි පළ කිරීමට විශේෂ අවසරයක් අවශ්‍ය නැත. සඟරාවේ පළවන අදහස් සමග ඔබ එකඟ නොවන හා එකඟ වන තැන් පිළිබඳ ඔබ දක්වන අදහස් අපි අගය කරමු.

සටහන

# අපේ සංස්කෘතික ප්‍රශ්නය



බහුජනතාව සඳහා, බහුජනතාවගේ අවශ්‍යතාවයන් නියෝජනය වන දෘෂ්ටියකින් අපේ සංස්කෘතික ප්‍රශ්නය සම්පාදනය කිරීම හා විචාරවත්ව විමසා බැලීමයි, මෙහි අරමුණ. ජාතික සංස්කෘතියට අදාළ කාරණයි, අප සංස්කෘතික ප්‍රශ්නය වශයෙන් සම්පාදනය කර ඇත්තේ. දේශපාලන ප්‍රශ්නය, ගොවි ප්‍රශ්නය, ජීවන වියදම් ප්‍රශ්නය වගේම, සංස්කෘතික ප්‍රශ්නයත් වෙනමම ප්‍රශ්නයක් වශයෙන් සම්පාදනය කිරීම කළ යුතුම කාරියකි.

විමසුමට කොටස් දෙකකි. පළමුව, 'ප්‍රශ්නය හා ජාතික ඉතිහාසය' කොටසින්, අප ඉතිහාස පෙරබිම ගොඩ නගනවා. දෙවනුව එන 'ප්‍රශ්නයේ ගමන් මඟ' යන කොටසින්, දේශපාලන හා සංස්කෘතික ක්‍රියාදාමයන් දෙකට අදාළව, සාහිත්‍යය වගේ නිශ්චිත නිර්මාණ ක්ෂේත්‍රයක් ක්‍රියාත්මක වී ඇති ආකාරය අප විභාග කර බලනවා. මේ කොටස අවසානයේදී, යුගයේ මූලික සංස්කෘතික යොමුවීම් සාරාංශ කරනවා. මේ විමසුම දළ හා සරල මුහුණුවරක් ගත්තත්, එය තවදුර කල් දැමිය නොහැකි කාරියකි. මේ විමසීම 1815 න් පසු යුගයට සීමා වෙනවා.

## ප්‍රශ්ණය හා ජාතික ඉතිහාසය

සංස්කෘතික ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගත හැක්කේ, එය ජාතික ඉතිහාස ආලෝක ධාරාවට හසුකර බැලීමෙනි. 1815 සිට අද දක්වා විහිදෙන නූතන යුගය, අධිරාජ්‍ය විරෝධී ජාතික අරගල යුගය වශයෙන් නම් කළ හැකියි. මුළුමහත් යුගයේම හරය හා එල්ලය, ජාතික අරගලය හා අධිරාජ්‍ය විරෝධයයි. හරය පිළිබිඹු කරන ප්‍රධාන ස්වරූප දෙකකි. ඉන් පළමුවැන්න යටත් විජිත විරෝධී බවයි, (1948 ට පසුව) දෙවැන්න නවයටත් විජිත විරෝධී බවයි. පළමු මුහුණුවර, සැබවින්ම හා එළිපිටම තිබුණු පරදේශීය අධිපතිකමකි. අනෙක, ඊට හාත්පසින්ම වෙනස්, සිතුවිලි ජාලයන් හා වෙළඳ රැහැන් තුළින්, ලාංකිකයින් ලවා හැංගි හොරා, කුලියට කර ගෙන යන පරදේශීය අධිපතිකමකි. විජිතවාදය කූට හා භයානක නම්, නවවිජිතවාදය ඊට වඩා කූටය, ඊට වඩා භයානකය. පළමුවැන්න මෙහෙයවේවෙ, ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් ය; දෙවැන්න මෙහෙයවන්නේ අධිරාජ්‍යවාදී බලවතුන් කල්ලියයි. දෙකම, බහුජනතාවට එරෙහිව, අධිරාජ්‍යවාදීන් හා ඔවුන් සේවය කරන දේශීය ගැත්තන් සඳහා, පැවැති හා පවත්වන, අධිපතිකමකි. මීට එරෙහිව අරගල ධජය එසවීම, දේශප්‍රේමී බහුජනතාවගේ උතුම් මෙහෙයයි.

(3 වැනි පිටුවට)

සංස්කාරකවරු: එස්. විජේසූරිය, ගාමිණී දිසානායක, සිරිල් අභයගුණවර්ධන, සුසිල් සිරිවර්ධන, පියල් සෝමරත්න, කුමුදු කුසුම් කුමාර

## අපේ සංස්කෘතික...

මේ යුගය තුළ, සංස්කෘතික ප්‍රශ්නය මුළුමනින්ම **ප්‍රගතිශීලී ජාතික සංස්කෘතිය** පිළිබඳ ප්‍රශ්නයක් බවට පත් වෙයි. එය අත්‍යාර්ථයෙන්ම ජනතාවගේ ප්‍රශ්නයකි. පරදේශීය අධිපති සංස්කෘතික අනසක සමග හැප්පෙන මොහොතේය, ජාතික සංස්කෘතික කලලය පිළිසිඳ නිර්මාණය වන්නේ. අපේ ජාතික සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නයේ අයතු ආයතු තේරුම් ගැනීම යනු අප අත් දුටු විජිත වාදයේ සුවිශේෂත්වය තේරුම් ගැනීමයි. එය ගොඩ නැගී ඇත්තේ, මේ ප්‍රමුඛ සාධකවලිනි.

1. ඉංග්‍රීසි විජිතවාදය පවත්වා ගත්තේ, යුදවාදී, ආර්ථික හා සංස්කෘතික වශයෙන් පරම අවි තුනක මුවාවෙනි. ආර්ථික හා සංස්කෘතික අවි පෙරබිමෙනුත්, යුදවාදී අවිය පසුබිමෙනුත් තබා ඔවුන් අප පාලනය කළා. ඉංග්‍රීසි විජිතවාදයේ සුවිශේෂත්වය රඳා පවතින්නේ, මේ **අවි තුන එකිනෙකට ගලපන ලද හුරුබුහුටිකම හා ඒ ගැලප්පීමේ සියුම් ඒකාග්‍රතාවය** උඩය. වැඩවසම් සමාජ යක් තුළට ඔවුන් ධනවාදය පිටින් පැටෙව්වේ, විශේෂ ආකාරයකටය. එනම් ආර්ථික දියවැලේ සියුම් යොත් කිඳා බස්වා, ඊට සමරූපී සංස්කෘතික දියවැලක් විසුරුවා හැරීම තුළිනි. එකක් අනික ශක්තිමත් කර ඉදිරියට පෙළඹුවේ, වශී කරණයක මුදු වේශයෙන් මිස, ගොරහැඩි හැප්පිලි ස්වරයකින් නොවේ.

2. සංස්කෘතිකව අපේ ආත්මය ඝාතනය කිරීමටත්, ඔවුන්ගේ වහල් චින්තාව අප තුළ තහර ගත කිරීමටත් ඔවුන් යෙදූ උපායමාර්ගයෙහි හරය තුන් ආකාරයකින් යුක්තයි. (i) ඔවුන් සම්පූර්ණයෙන්ම හැදුවේ අපව **ඇතුළතින්** (බුද්ධිමය වශයෙන්) දිනා ගැනීමටයි. (ii) ඔවුන් අප වෙත එල්ල කළ ප්‍රහාරය **ප්‍රමාණාත්මක වන තරමටම ගුණාත්මකයි.** (iii) ඔවුන් අතිශයින්ම **උපායශීලී** විය. 1834 දී අධ්‍යාපනය පිළිබඳ ඔහුගේ සුප්‍රකට සටහනින් මැකෝලි සාමි ඉන්දියාවේ යටත් විජිත අග්‍රාණ්ඩුකාරවරයාට කළ නිර්දේශය, මේ උපායමාර්ගය හොඳින් කැටි කර දක්වයි: 'අප හා අප පාලනය කරන කෝටි සංඛ්‍යාත ජනතාව අතර පුරුකක් ලෙස කටයුතු කළ හැකි පංතියක් බිහි කිරීමට අප හැකි තරම් වෙහෙසිය යුතුයි. ඔවුන්, ලෙයින් හා පාටින් ඉන්දියානුවන් විය යුතු වන අතර, රසිකත්වයෙන්, අදහස් උදහස්වලින්, ගුණ දහම්වලින් හා බුද්ධියෙන් ඉංග්‍රීසින් විය යුතුයි'. සණ මෙන්ම පළල් සංස්කෘතික ප්‍රහාරයක පෙරමුණු අවිය අධ්‍යාපනය බවට පත් කරමින්, ඔවුන් අපේ ස්වීයත්වය, ස්වශක්තිය, ආත්ම විශ්වාසය හා දේශප්‍රේමීත්වය ගතට සිතට නොදැනීම ඛාදනය කර හැරීමට තැත් කළ අතර, ඒ එක්කම, ඔවුන්ගේ සංස්කෘතික හා සදචාරාත්මක පිළිවෙත් හා වටිනාකම් හින්සිරුවේ අපේ මනැස් තුළ පැළ පැදියම් කළා.

3. මේ සියුම් උපායශීලීත්වය නිසාම, ඉංග්‍රීසි විජිතවාදය ව්‍යාජ, සුමිතුරු නිදහස්වාදයක මුහුණුවර ඉසිලුවා. ඉන් අපේ සැකකිරීමේ සිරිතත්, විචාරයත් අඩාල වුනා. මේ උපායශීලීත්වයේ ප්‍රකට ලක්ෂණයක් නම්, දෙගොල්ල අතර ප්‍රතිවිරෝධතා මෝරා, පුපුරා යන්නට කලින්, ඔවුන්ගේ පැවැත්ම රැකෙන පරිදි, අප සමග සම්මුති ගැහීමේ පිළිවෙතයි.

4. එහි ගැඹුර, සණත්වය හා පටුත්වය නිසා, මතවාදීව හා දෘෂ්ටිමය වශයෙන් ඔවුන් අපට කළ අලාභ හානිය අති විශාලය. ඔවුන් ඇතුළතින් පවත්වාගෙන ගිය, නැත්නම් ආත්මගත විජිතවාදයෙන්, අපේ දේශප්‍රේමීව හා ස්වාධීනව සිතීමේ හැකියාව දියාරු කර, අඩපණ කිරීමට කටයුතු කෙරුණා.එය කොතරම් බලගතු විද කිව්වොත්, එය අපේ ප්‍රගතිශීලී, මාක්ස්වාදී චින්තනයටද හානිකර ලෙස බලපා තිබෙනවා. අපට මාක්ස්වාදී හෝ ජාතික හෝ ලංකා ඉතිහාස විග්‍රහයක් නැති කම, එක් ප්‍රබල නිදර්ශනයක් පමණයි.

5. ලංකාවේ කුඩාකම නිසාම ඉංග්‍රීසි බලපෑම සෑම අස්සක් මුල්ලක් නෑරම ගැඹුරට පැතිරුනා. මේ අතින්, ඉන්දියාව වගේ රටක, පරදේශීය බලපෑම ගම්බද කරා විහිදුනේ යාන්තමිනි.

විජිතවාදය කූට හා භයානක නම්, නවවිජිතවාදය ඊට වඩා කූටය, ඊට වඩා භයානකය. පළමු වැන්න මෙහෙයෙව්වේ, ඉංග්‍රීසි අධිරාජ්‍යවාදින්ය; දෙවැන්න මෙහෙයවන්නේ අධිරාජ්‍යවාදී බලව තුන් කල්ලියයි. දෙකම, බහුජනතාවට එරෙහිව අධිරාජ්‍යවාදීන් හා ඔවුන් සේවය කරන දේශීය ගැත්තන් සඳහා පැවති හා පවත්වන, අධිපති කමකි. මීට එරෙහිව අරගල ධජය එසවීම, දේශප්‍රේමී බහුජනතාවගේ උතුම් මෙහෙයයි.

මේ තරම් සාර්ථකව ඉංග්‍රීසින් පාලනය කළ විජිතයක් නැතැයි කිවහැක. හරය අතින් සියලු විජිතවාද එක සමාන වුනාට, ගුණය හා ප්‍රමාණය අතින්, ඉංග්‍රීසි විජිතවාදය, ප්‍රංශ, ඕලන්ද, පෘතුගීසි වැනි අනෙක් විජිතවාදවලට වඩා වෙනස් බව පේනවා. ඉංග්‍රීසි විජිතවාදය සුවිශේෂ වූ තරමටම, ජාතික වශයෙන් ඉන් අපට දිගු කාලීනව සිදු වුණු හානිය බරපතලය.

විජිතවාදයට වඩා නවවිජිතවාදයේ හරය හා අරමුණු සියුම්ය, රහසිගතය. කලින් වකවානුවේ ජාතික අරගලය පැවති තලයට වඩා මුහුකුරා ගිය තලයකය, නවවිජිතවාදය යටතේ ජාතික අරගලය ක්‍රියා කරන්නේ. මේ වන විට, ජාතික අරගලය කෙරෙහි බහුජනතාව එක්තරා තිර පාලනයක් හෙලන අතර, ඔවුන් උකහා ගෙන ඇති අතිශය කටුක පාඩම් හේතුවෙන්, ඔවුන්ගේ අධිෂ්ඨානයද වැඩී ඇත. ස්වශක්තිය, දේශප්‍රේමීත්වය, ආත්ම විශ්වාසය හා ස්වීයත්වය – කොටින්ම ජාතික බව පැහැදිලි හා ස්වාධීන පැවැත්මක් ගොඩ නගා ගෙන ඇත. මතවාදී හා දෘෂ්ටිමය වශයෙන්, බහුජනතාව සෑහෙන ප්‍රගතිශීලීත්වයක් අත් කර ගෙන ඉවරය. එහෙත්, නවවිජිතවාදයට එරෙහි අවි, විජිතවාදයට එරෙහි අවිවලට වඩා වෙනස් විය යුතුය.

නවවිජිතවාදය කාන්දු වන එක් නිත්‍ය නෙත්තියක් සංස්කෘතිය නිසා, ඊට අදාල අරගලය විශේෂ ප්‍රමුඛතාවයක් දරයි. උසස්ම මට්ටමේ සිට පහත්ම මට්ටම දක්වා දැනුම, සිතුවිලි, තාක්ෂණය, සදචාරය, කලාව, සාහිත්‍යය යනාදී දෘෂ්ටිමය සඳසයන් නිර්මාණය වීම, මේ සංස්කෘතික නෙත්තියේ මහිමයෙන් සිදු වන්නේය. ඒ නිසා, එක් මට්ටමකින් අරගලය යෙදී ඇත්තේ, ජාතික සංස්කෘතික සම්පත් හා උරුමයන් බහුජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා තව දුරට යොදවා ගැනීම මතයි. මේ මට්ටමේ අරගලය, හතුරු ප්‍රතිවිරෝධතා අතර එකකි. අනෙක් අරගල මට්ටම නම් අප අප අතරම කෙරෙන විවාදයකි. බොහෝ අවස්ථාවලදී, මේ දෙවෙනි මට්ටමේ අරගලය, අනෙක තරම් පැහැදිලි නැත. කලාව හා සාහිත්‍ය තලය එවැන්නකි. සංස්කෘතිකව බහුජනතාවට සේවය කරන්නේ කොහොමද, බහුජනතාවට ගොදුරු වන පරිදි ජාතික සම්ප්‍රදාය සහ සමකාලීන සමාජ ප්‍රතිවිරෝධතාවයන් එකිනෙකට ගලප්පා, නව හරයක් ගොඩ නගන්නේ කොහොමද, සංස්කෘතිකව ස්වශක්තිය යන්නෙහි තේරුම මොකක්ද යනාදී ප්‍රශ්න හරහාය, මේ දෙවෙනි අරගල මග වැටී ඇත්තේ. මේ මට්ටමේ අරගලය, මිතුරු ප්‍රතිවිරෝධතා අතර එකකි.

නවවිජිතවාදී වකවානුවේදී ප්‍රගතිශීලී ජාතික සංස්කෘතික ව්‍යාපාරයට තව විශේෂ වගකීමක් බාර වෙනවා. එනම්, සංස්කෘතික ව්‍යාපාරය බහුජන ව්‍යාපාරයේ අනෙක් අංග වන දේශපාලන, ආර්ථික හා සමාජමය ව්‍යාපාරයන් සමග අතිනත ගෙන යා යුතු බවයි.

### ප්‍රශ්නයේ ගමන් මග

මේ කොටසින් අප කරන්නට බලාපොරොත්තු වන්නේ, සාහිත්‍ය ක්‍රියාදාමය පමණක් වෙන් කරවා ගෙන, එය දේශපාලන හා සංස්කෘතික ක්‍රියාදාමයන්ට සාපේක්ෂව ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳ දළ හා සරල විග්‍රහයක් ඉදිරිපත් කිරීමටය. අපේ

# අපේ සංස්කෘතික...

සාහිත්‍ය ගමන් මගෙන් අපේ සංස්කෘතික ගමන් මග නියෝජනය වන පමණට, මේ කරුණු දැක්වීමෙන්, අපට සංස්කෘතික ප්‍රශ්නයේ ගමන් මගද එලි පෙහෙලි වන්නේය. 1860 ගණන්වල සිට 1930 ගණන් දක්වා, 1930 ගණන්වල සිට 1940 ගණන් දක්වා, 1940 ගණන්වල සිට 1956 දක්වා හා, 1956 සිට අද දක්වා යනුවෙන් අවධි හතරකට බෙදීමෙනි, අප කරුණු පැහැදිලි කර ඇත්තේ. අවසාන වශයෙන් යුගයේ දක්නට ලැබෙන මූලික යොමුවීම් නැත්නම් මුඛ්‍ය ක්‍රියාදමයන් අප පිළිවෙලින් සාරාංශ කර තිබෙනවා.

## 1860 ගණන්වල සිට 1993 ගණන් දක්වා අවධිය

1815 දී පූර්ණ පරාධීනත්වයට කැපවුණු ලක් ජනතාව, 1817-18 හා 1848 උදර යටත් විජිත විරෝධී නිදහස් සටන් දෙකට පසු, යළි තිරව ජාතික අරගලයේ ධජය එසෙව්වේ, 1860 ගණන්වල මුල පිරූ ජාතික සංස්කෘතික ප්‍රබෝධයත් සමගය. බහුජන පන්නරයෙන් ඔප් වුණු වෙනමම ජාතික දේශපාලනයක් නොතිබුණු ඒ අවධියෙහි, ජාතික දේශපාලනයද ගත්තේ, සංස්කෘතික ස්වරූපයකි. එකල බහුජන දේශපාලන ක්‍රියාදමය පැවතුනේ සංස්කෘතික ක්‍රියාදමය තුළය.

අධිරාජ්‍ය විරෝධී අරගලයේ තුන්වෙනි පිම්මත් සමඟ පෙරමුණට ආ සංස්කෘතික ප්‍රබෝධය, අවධියට සාපේක්ෂව, පළල් හා උණුසුම් ජාතික පරිමාණයක් ඉසිලුවා. මේ සංස්කෘතික ව්‍යාපාරය, එකිනෙකට පැහැදිලිව සම්බන්ධ වුණු වෙනස් ව්‍යාපාර සමුදයකින් ගොඩ නැගුනකි. මේ ව්‍යාපාර සියල්ලම වාගේ ඉසිලුවේ නිශ්චිත යටත් විජිත විරෝධී හැඩරුවකි. පිරිවෙන් පිහිටුවීම, බෞද්ධ අධ්‍යාපන ව්‍යාපාරය, වාද විවාද පුරාණය, බෞද්ධ පුනර්ජීවනය, නාට්‍යෝදය හා සාහිත්‍යෝදය, අමද්‍යප ව්‍යාපාරය, අවිහිංසාවාදී ව්‍යාපාරය, සිංහල පුවත් පත් සහරා නවෝදය හා කම්කරු ව්‍යාපාරය වශයෙන් එය ගොඩනැගුනා. එය ප්‍රමාණයෙන් ජාතික විය; ගුණයෙන් දේශප්‍රේමී විය.

## 1930 ගණන්වල සිට 1940 ගණන් දක්වා අවධිය

මේ දශකයන් දෙක, අපේ ජාතික ඉතිහාසයේ විශේෂයෙන් වැදගත් විසි අවුරුද්දකි. ඊට තෙරපුණු සිද්ධි සමුදය, ප්‍රමාණයෙන් හා ගුණයෙන් සැලකිය යුතු තරම්ය. මේවා සමහරක් නම්, සර්වජන ඡන්දය, රාජ්‍ය මන්ත්‍රණ සභා ඉතිහාසය හා එහි (සීමිත වුවත්) බහුජන අන්තර්ගතය, (යුරෝපයේ ආර්ථික පරිහානිය නිසා) ආර්ථික හැලහැප්පිලි හා ඒවායේ ප්‍රතිඵල, දෙවෙනි ලෝක යුද්ධය හා එහි බලපෑම, වාමාංශික හා කම්කරු ව්‍යාපාරයේ සංවර්ධනය හා නිදහස් අධ්‍යාපනය පෙරටු කොට ගත් සුභසාධක පිළිවෙත් සමූහයයි. මේ විසි අවුරුද්ද තුළදී අපේ පංති ක්‍රමයත් සැහෙන්න විකාශනය වුනා. මේ ප්‍රතිසංස්කරණ බහුජනතාවට වඩා ඉහළ හා මැද මට්ටම්වලට බලපෑ නමුත්, දේශපාලන, සමාජමය හා ආර්ථික වශයෙන්, වකවානුව පෙරළිකාරී එකක් විය. ඊට නිශ්චිත සංස්කෘතික ප්‍රතිචාරයන්ද විය. ඒවා සාකච්ඡා කිරීම පසුවට තබා ඇත.

1930 ගණන්වලදී සිට, සංස්කෘතික ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් විය. එතෙක් ලියලමින් ආ මුළුමහත් බහුජන ව්‍යාපාරයට පෙරමුණක් සැපයූ සංස්කෘතික ව්‍යාපාරය, ඉන් පසුව, දේශපාලන හා සංස්කෘතික වශයෙන් දෙකට බෙදෙන්නට පටන් ගත්තේය. ඊළඟ විසි අවුරුද්ද තුළදී, දේශපාලන ව්‍යාපාරය පිම්මක් ගත්තේය. සංස්කෘතික ව්‍යාපාරයද පිම්මක් ගත් නමුත්, එක්තරා අඩුවක් නිසා, එහි නියම හැකියාවන් මල් පල ගැන්වුනේ නැහැ. මේ වකවානුවේ සුවිශේෂතාවයන් වන්නේ, දේශපාලන හා සංස්කෘතික ව්‍යාපාරයන් දෙක අතර, බහුජනතාවට **අවශ්‍යව තිබුණු හා හිතකර වුණු**, පෑහීමක් සිදුනොවී, දෙක වෙන් වෙන්ව ගමන් කිරීමයි. අධිරාජ්‍යවාදීන් සමග සම්මුති ගැසූ ප්‍රතිගාමී පිළෙන් මෙන්ම, එසේ සම්මුති නොගැසූ ප්‍රගතිශීලී පිලෙන්ද මේ පෑහීමේ කටයුත්තට නායකත්වයක් දීමේ වගකීම කර අරිනු ලැබීම, වැදගත් වගේම අවසනාවන්ත පුවතකි.

සාහිත්‍යයේ ගමන් මග මතු වෙන්නේ, මුල් හා මේ අවධි දෙකම තරණය කරමින්ය. පියදස සිරිසේන, ඩබ්ලිව්. ඒ. ද සිල්වා, මාර්ටින් වික්‍රමසිංහ, ආනන්ද රාජකරුණා, ජී. එච්. පෙරේරා, වැනි ලේඛකයන් මීට කලින් වකවානුවේ තම තමන්ගේ මුල් පොත් පළ කළ නමුත්, ඔවුන්ගේ නියම සංවර්ධනය අයත් වන්නේ මේ අවධියටයි. මතවාදී හා දෘෂ්ටිමය වශයෙන් මෙ කල ලේඛකයන්ගේ ප්‍රධාන ස්ථාවරය වූනේ, දේශප්‍රේමීත්වයයි. එය මුල් සංස්කෘතික රැල්ලෙන් ඉදුරාම බලාපොරොත්තු විය යුත්තකි. ඔවුන්ගේ දේශප්‍රේමීත්වය **විවිධ ස්වරූපවලින් හා විවිධ මට්ටම්වලින්** ප්‍රකාශ වුනා. එය ජාතික සංස්කෘතික උරුමය මුල් කර ගෙන ගොඩ නැගුණා. මේ දෘෂ්ටියමයි, ඔවුන්ගේ කෘතිවල අන්තර්ගතය තීන්දු කළේ. ඔවුන් ලේඛකයන් වශයෙන් කෙලින්ම ජාතික වගකීමක් බාර ගත්තා. ඔවුන් පැහැදිලිවම බහුජනතාව සඳහාය ලිව්වේ. එහෙත් ඒ කටයුත්ත සඳහා යොදා ගත් අදහස් කට්ටලයේ නිශ්චිත ස්වරූපය එක් එක් ලේඛකයා සම්බන්ධයෙන් විමසිය යුතුය. එහිදී ඔවුන් අතර පැහැදිලි සීමාවන් තිබුණු බව පේනවා. ඔවුන් බොහෝ දෙනෙක් ප්‍රශ්න දෙස බැලුවේ, ඉතා දළ, කලු සුදු ඇසකිනි. දේශීය සංස්කෘතික උරුමය ඔවුන්ට පෙණුනේ නොවෙනස්ව පවතින ස්ථිතික වස්තු සම්භාරයක් වශයෙනි. මේ අතින් ඔවුහු මනෝරාජික වූහ. එය විචාරවත්ව තේරුම් ගැනීමට ඔවුහු තරමක් දුරට අපොහොසත් වූහ. මේ අතිනි, වික්‍රමසිංහ විශිෂ්ය වන්නේ. ඔහුගේ සමකාලීනයන් හැම දෙනාටම වඩා, ඔහු මතවාදය හා දෘෂ්ටිය ගැන වෙහෙසුනා; ගවේෂනාත්මක හා විචාරාත්මක පිපාසයකින් තැවුනා. ඒ නිසාය, ඔහු ඊළඟ අවධි දෙකම තරණය කිරීමට තරම් ජීවය ලැබුවේ.

ශිල්පීය වශයෙන්, මේ පරම්පරාවට දැඩි අභියෝග තිබුණා. නව කලාංග ජනප්‍රිය කිරීමේ කාරිය පමණක් නොව, බටහිර කෘති අනුකරණය කිරීමෙන් මිදී, ස්වාධීන ලේඛන සම්ප්‍රදායන් ගොඩ නැගීමේ පුරෝගාමීන් වූනේද, ඔවුන්මය. කල්පිතවාදී හා යථාර්තවාදී කලා ශෛලීන් අතර ප්‍රතිවිරෝධය හමුවේ, ඔවුන්ගෙන් බහුතරය ක්‍රියා කළේ කල්පිතවාදයට නැඹුරුවයි.

## 1940 ගණන්වල සිට 1956 දක්වා අවධිය

කලින් වකවානුවේ දෙකඩ වුණු දේශපාලන හා සංස්කෘතික ව්‍යාපාරයන් දෙක, මේ වකවානුවේදී තවදුර නියර දෙකක ගමන් කරයි. එහෙත් 1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමත් සමග, යළිත් ක්‍රියාදමයන් දෙකෙහි පෑහීමක් සිදු වීමට හින්සිරුවේ පටන් ගනියි. එහි අඩිතාලම මේ වකවානුවේදී වැටෙයි, එහි එල දැරීම ඊළඟ වකවානුවේදීය.

දේශපාලනිකව, මෙය තීරණාත්මක අවධියකි. නවවිජිතවාදය රෝපණය වෙයි. කෙටි කාලයක් තුළ, ආර්ථික වශයෙන් (කොරියානු යුද්ධ අවධියේදී සහ ඊට පසු කාලයේදී) නැගීමක් හා බැසීමක් සිදු විය. එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේ, පංති අරගල මුවහත් වූනේය. හර්තාලය සිදුවිය. ප්‍රගතිශීලී

1930 ගණන්වලදී සිට, සංස්කෘතික ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් විය. එතෙක් ලියලමින් ආ මුළුමහත් බහුජන ව්‍යාපාරයට පෙරමුණක් සැපයූ සංස්කෘතික ව්‍යාපාරය, ඉන් පසුව, දේශපාලන හා සංස්කෘතික වශයෙන් දෙකට බෙදෙන්නට පටන් ගත්තේය. ඊළඟ විසිඅවුරුද්ද තුළදී, දේශපාලන ව්‍යාපාරය පිම්මක් ගත්තේය. සංස්කෘතික ව්‍යාපාරයද පිම්මක් ගත් නමුත්, එක්තරා අඩුවක් නිසා, එහි නියම හැකියාවන් මල් මල ගැන්වුනේ නැහැ. මේ වකවානුවේ සුවිශේෂතාවයන් වන්නේ, දේශපාලන හා සංස්කෘතික ව්‍යාපාරයන් දෙක අතර, බහුජනතාවට අවශ්‍යව තිබුණු හා හිතකර වුණු, පෑහීමක් සිදුනොවී, දෙක වෙන් වෙන්ව ගමන් කිරීමයි.

## අපේ සංස්කෘතික...

ව්‍යාපාරය පිම්මක් ගත්තේය. එහෙත් සංස්කෘතික ව්‍යාපාරය හා මෙය අතර නිශ්චිත සංවාදයක් නොපැවති නිසා, **ප්‍රගතිශීලී පිළට දිනා ගත හැකිව තිබුණු** කලාකරුවන් හා ලේඛකයන් (කොළඹ කවීන් හා ගද්‍යකරුවන් වැඩි දෙනෙක්) සැහෙන දෙනකුගේ සේවය ඊට අහිමි විය. මීට තව වැදගත් හේතුවක් තිබුණේය. ඒ, සංස්කෘතික ව්‍යාපාරය තුළම ඇති වුණු විපර්යාසයකි.

තිස් හතලිස් දශක දෙකේ ඇති වුණු දේශපාලන, ආර්ථික හා සමාජමය පෙරළියට සමරූපී සංස්කෘතික පෙරළිය, මේ කොටසේ සාකච්ඡා කරන බව අප ඉහතින් කීවා. ඊට හේතුව, සංස්කෘතික ව්‍යාපාරය වකවානු දෙකම හරහා යැමයි.

1930 ගණන්වල සිට පිම්මකින් වැඩුණු සංස්කෘතික ක්‍රියාදාමයේ කේන්ද්‍රීය අත්දැකීම වන්නේ, ඒ තුළම හට ගත් ප්‍රතිවිරෝධතාවයකි. ඒ හේතුවෙන්, සංස්කෘතික ව්‍යාපාරයද දෙකට බෙදේ. මේ බෙදීම අපූරුවට නියෝජනය කරන්නේ කොළඹ කවිය හා පේරාදෙණි කවියයි. මීට පළල්ව **'කොළඹ සාහිත්‍යය'** හා **'පේරාදෙණි සාහිත්‍යය'**ය කීවත් සාධාරණය. මේ දෙකඩ වීමට හේතු පැහැදිලි කර ගැනීම, අද අපට ඉතාමත්ම වැදගත්ය.

ඊට පළල් හා දුරස්ථ හේතුව ලෙස අප දකින්නේ මෙරට පංති ඉතිහාසය තුළ ඇති වන සුළුධනපති පංතියේ නිශ්චිත හා සීඝ්‍ර සංවර්ධනයයි. දෙකඩවීමේ දළ සමාජ පදනම, එයයි. එහෙත් මේ පළල් හා දුරස්ථ හේතුව වාස්තවිකව ප්‍රකාශ කරන සමීප හේතුවක්ද තිබෙනවා. ඒ නම්, 1942 දී ආරම්භ කළ ලංකා විශ්ව විද්‍යාලයයි. එදා සිට පේරාදෙණිය දක්වාම මේ සරසවි ක්‍රියාදාමය විකාශනය වෙයි. සංස්කෘතික වශයෙන් සරසවිය ප්‍රතික්‍රියා කළ ආකාරය දැන් විමසා බලමු.

එකල ලක් සරසවියේ චින්තන යොමුව සම්පූර්ණයෙන්ම වාගේ හැරී තිබුණේ, විජිතවාදයට ගැති, ස්වීයත්වය යට කළ නියරකටයි. ජාතික හා දේශප්‍රේමී ගති ලක්ෂණ, ඒ බුද්ධිමය සම්ප්‍රදාය තුළ විරල විය. බහුජනතාවගෙන් එය වියෝව සිටියේය. එහි ශාස්ත්‍රීය හා චින්තනීය අභියෝග මූලමණින්ම වාගේ හැඩ ගැසුනේ පරදේශීයව ණයට ගත් දෘෂ්ටීන් හා වටිනාකම් අනුවය. නව සරසවි ව්‍යාපාරය, දේශීයත්වය පර දේශීයත්වයට යට කළේය. බහුජනතාව සමග සංවාදය පුපුරුවා හැරියේය, සරසවිය බුද්ධිමතුන් සුළුතරයක මනෝරාජික කෙම්බිමක් බවට හැරෙව්වේය, විදග්ධතාවය හා ශාස්ත්‍රීයත්වයේ නාමයෙන් අන් සියල්ල පළවා හැරියේය. මෙන්න මෙවැනි තත්ත්වයන් තුළිනි, සරසවියේ සේවය කළ හා එහි සමීප ඇසුර ලැබූ සාහිත්‍යකාමීන් විසින්, අවසානයේදී පේරාදෙණි ගුරුකුලය බිහි කළේ. එය විදග්ධ, **'සුළුතර ගුරුකුලයකි'**. ඊළඟ වකවානුවේදී එහි සාහිත්‍යයට පේරාදෙණි සාහිත්‍යය වශයෙන් නම් කිරීම යුක්ති සහගතයි.

බෙදීමේ අනෙක් නියර, කොළඹ කවිය හා සාහිත්‍යය ප්‍රකාශ කරයි. එහි සළල් සමාජ පදනමත් අප කලින් කී සුළුධනපති පංතියේ සංවර්ධනයයි. එහෙත් එහි සමීප සමාජ පදනම වුනේ බහුජනතාවගේ විවිධ අත්දැකීම්ය. කේයස් සහ අල්විස් පෙරේරා වැනි කවීන්, දැනුවත්වම ප්‍රගතිශීලී දේශපාලනයෙන් තම කවියට පෝෂණයක් ලැබුවා. කුමාරගම වැනි කවියකු, පළල් මානවීයවාදයක් සාධනය කර ගත්තා. මහින්ද හිමි හා මුනිදාස කුමාරතුංග උදාර, දේශප්‍රේමී, අධිරාජ්‍ය විරෝධී කවි ලිව්වා. මේ සියලු දෙනාම ජාතික සාහිත්‍ය සම්ප්‍රදාය මුල් කර ගෙනය, තම ශිල්පය සංවර්ධනය කළේ. කොළඹ යුගයේ මෙවැනි විශිෂ්ටම කවීන් විසින්, නව හරයක් හසුකර ගනු ලැබුවා. කොළඹ කවියේ අනන්ත රොඩු බොඩු හා දුර්වලකම් තිබුණා. එහෙත් අප එය අගැයිය යුත්තේ එහි සාරවත් කවිවලිනි. මේ කවීන් නියෝජනය කළේ බහුතරයයි. ඔවුන්ට **'බහුතර ගුරු කුලය'** වශයෙන් නම් කිරීම සාධාරණය.

මාර්ටින් වික්‍රමසිංහද බහුතර ගුරුකුලයට අයත් වෙයි. ඔහුගේ සමාජ යථාර්ථය පිළිබඳ අවබෝධයයි, ප්‍රගතිශීලී දෘෂ්ටියයි, යථාර්තවාදී සාහිත්‍ය රීතියයි එකමුතු වී ගොඩ නැගෙන සාරවත්බව, මේ වකවානුවේත්, ඊළඟ වකවානුවේත් විශිෂ්ඨ ජයග්‍රහණයකි.

සුළුතර, බහුතර ගුරුකුල දෙක අතර පැවති මිතුරු ප්‍රතිවිරෝධතාවය, ඊළඟ වකවානුවේදී හතුරු ප්‍රතිවිරෝධතාවයකට පරිවර්තනය වෙයි.

## 1956 සිට අද දක්වා අවධිය

1956 බහුතර බලවේගය තුළ දේශපාලනික මෙන්ම සංස්කෘතික නියෝජනයක් තිබුණත්, එහි සංස්කෘතික ජයග්‍රහණය දේශපාලන ජයග්‍රහණයට සමාන **නොවන** බව අපේ ඇදහීමයි. මතුපිටින් හා ප්‍රමාණිකව (සිංහලය රාජ්‍ය භාෂාව වීම, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වැඩ) එය ජයග්‍රහණයක් වශයෙන් පෙණුනත්, ඇත්තෙන්ම එය තිර මුදුන්පත්කිරීමක් නොවේ.

ඊට හේතුව, 1956 සිට 1970 දක්වා, සංස්කෘතික ක්ෂේත්‍රයේ බලය හා පාලනය සුළුතරය අතේ තිබීමයි. ජයග්‍රහණය තිරද, නැද්ද යන්න තීරණය කරන්නේ, අධිපතිකම දැරූ කණ්ඩායමේ ස්වභාවයයි. සාහිත්‍ය හා සංස්කෘතික ක්ෂේත්‍රවල දර්ශනය, හර හා විචාර මිම් සකස් කළේ ඔවුන්ය. මේ වකවානුව තුළදී, බහුතරය නොකඩවා තම සාහිත්‍ය කටයුතු කළ බව සැබවි. ඒත් සුළුතරය අතෙහි තිබුණු විචාර සංස්ථා තුළින්, බහුතරයේ ලේඛකයන්ට නිසි ගෞරවය ලැබුණේ නැත. විදග්ධ විචාරයෙන් විමලරත්න කුමාරගම ප්‍රමුඛව, කේයස්, මහින්ද හිමි, අල්විස් පෙරේරා, පියදාස සිරිසේන, මායා රංජන් වැනි ලේඛකයන්ට කර ඇති **අසාධාරණය** බරපතලයි. බහුතර කණ්ඩායමේද බලගතු අඩුපාඩු තිබුණේය. ඉන් ප්‍රධාන වන්නේ ඔවුන්ගේ **දෘෂ්ටිමය දුප්පත්කමයි**. මේ හේතුවෙන්, සුළුතර ගුරුකුලයට එරෙහිව සංවිධානාත්මක හා හරවත් විචාර විවාදයක් පවත්වා ගැනීමට ඔවුන් අපොහොසත් වුනා. දෙගොල්ල අතර විවාදය හරවත්ව නො කෙරුණු නිසාම, ප්‍රතිවිරෝධතාවයට අවශ්‍යව තිබුණු පිපිරීම ඇති වුනේ සංස්කෘතික ඉම තුළ නොව, ඊට පිටතින් වූ දේශපාලන බිමෙහිය. 1930 ගණන්වල සිට ගබ්සා වෙමින් පැවති දේශපාලනය හා සංස්කෘතිය අතර පැහීම 1970 වනවිට **බහුජනතාව නැවතත් විෂයමූලව ඇති කළා.**

1960 දශකයේ මැද ගණන්වලදී සිට (ගුණදාස අමරසේකර වැනි අය විසින්) ඇතුළතිනුත්, (සේන අරුනලු බණ්ඩාර, මාර්ටින් වික්‍රමසිංහ, දේශබන්ධු, කරුණාසේන ජයලත්, වැනි අය විසින්) පිටතිනුත් සුළුතරයේ පදනම ප්‍රශ්න කෙරුනා. එහෙත් 1970ට පසුවය, එහි ආධිපත්‍යය ඊට වඩා පැතුරුණු හා නිරතුරු ප්‍රශ්න කිරීමකට භාජනය වුනේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කෙලින්ම, 'ජනතා' යන විශේෂණ පදයෙන් සැරසුණු, **'ජනතා සාහිත්‍යයක්'** හා **'ජනතා කලාවක්'** යන පාඨ සම්මත වුනා.

ජාතික සංස්කෘතික ගමනේ අද අප ඉන්නේ **අති තීරණාත්මක අවධියක** බව අපේ විශ්වාසයයි. එය එසේ වන්නේ, ජාතික සංස්කෘතික අරගලය, බහුජනතාවගේ අවශ්‍යතාවයන් අනුව ප්‍රමාණවත්ව තෝරා බේරා නැති නිසාය. ඒ තෝරා බේරීම ප්‍රමාණයෙන් අසම්පූර්ණ නම්, ගුණයෙන් ඊටත් වඩා අසම්පූර්ණය. බහුතරය හා සුළුතරය අතර අරගලය අද වෙන කිසිදකටත් වඩා තියුණුව කෙරී ගෙන යනවා. එහෙත් එය බහුතරයට තිරව වාසි වෙන අයුරු තීරණය වී නැහැ. නව විජිතවාදී උපායන් සියල්ලම අප හමුවේ වැජඹෙයි. කවුරුත් වාගේ ප්‍රගතිශීලී මුහුණු බැඳ ගැනීමට පසුබට වන්නේ නැත. බහුජනතාව වෙනුවෙන් පෙනී සිටීම ගැන කතා කරන්නන් බහුලය; ඔවුන් වෙනුවෙන් සැබෑ ලෙස පෙනී සිටින්නන් විරලය; සංස්කෘතික සංස්ථා බොහෝමයක අධිපතිකම තවම උසුලන්නේ සුළුතර කණ්ඩායමයි. එහෙත් විෂයමූලව, විශේෂයෙන්ම, පොතේගුරුවාදවලින් කුරෝලු නොවුණු, දිවිපෙවෙත නම් කටුක සිප්හලෙන් තම මනස සරුසාර කර ගත් විශාල බහුතරයක් විසින් හරයෙන් හා ගුණයෙන් වෙනස් වූ නව සමාජ යථාර්තයක් ඉල්ලා සිටිනවා. ප්‍රගතිශීලීන් වෙත පැවරෙන වගකීම හා අභියෝගය මහත්ය. දෘෂ්ටිමය වශයෙන් සුළුතරය පැහැදිලිවම අභිබවා ගොස්, බහුජනතාවගේ අරගලයෙන් නිසි දිරිය, ලබා ගෙන, සෑම නිර්මාණ හා විචාර ක්ෂේත්‍රයකින්ම තිර ජයග්‍රහණ සාධනය කර ගැනීමෙන් පමණි, ජාතික සංස්කෘතික අරගලය බහුජනතාවට නිත්‍ය ලෙස වාසි ගෙන දෙන අන්දමට නැඹුරු කර ගත හැක්කේ.